**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම - 2016**

-----------------------------------------------------------

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

--------------------------------

(අ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමෙන් තොරව කොළඹ කර්මාන්තශාලාවේ සවි කිරීම සඳහා 2011 ජනවාරි 20 දින කල් බදු පදනමට මිලදීගත් රු. 104,177,779 ක් වටිනා යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් 2013 අගෝස්තු 30 දින පොළොන්නරුව කර්මාන්තශාලාවේ සවිකර තිබුණු අතර මෙම යන්ත්‍ර හා පිරියත පද්ධතියේ පැවති තාක්ෂණික දෝෂ හේතුවෙන් එය මිලදී ගත් දින සිට විගණිත දිනය වූ 2017 ජූලි මාසය දක්වාම භාවිතයට ගත නොහැකිව පැවතුණි. ඒ හේතුවෙන් මෙම යන්ත්‍ර හා පිරියත පද්ධතියේ වටිනාකම වෙනුවෙන් හානිකරණ ගැලපීම් සිදුකල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) කර්මාන්තශාලා නවීකරණය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් ණය සම්බන්ධයෙන් එලඹෙන ලද ගිවිසුමට අනුව නියමිත කාල රාමුව තුළ ණය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් භාණ්ඩාගාරයට ගෙවිය යුතු සියයට 2 ක පැහැර හැරීමේ පොලිය සම්බන්ධයෙන් සමාගමේ ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන වගකීම් රු.මිලියන 117 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාගමෙහි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව, ඉහත නවීකරණ ව්‍යාපෘතිය සඳහා රු. 6,189,574,828 ක්ද බඩල්ගම කර්මාන්තශාලාවේ කිරි සකස් කිරීමේ යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා රු. 4,831,791,167 ක්ද වැය කර ඇති බව දක්වා තිබුණද, ඒ තුලින් වැඩි කරගත් ධාරිතාවයට ප්‍රමාණවත් කිරි සැපයුමක් නොමැති බව වර්තමාන කළමනාකරණ වාර්තා හා කළමනාකරණ විමසීම් අනුව නිරීක්ෂණය විය. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ප්‍රකාරව අදාළ වත්කම් හානිකරනය සඳහා ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත සඳහන් කර්මාන්තශාලා නවීකරණය ව්‍යාපෘතිය යටතේ කර්මාන්තශාලා 3 ක් සඳහා හා බඩල්ගම නව කර්මාන්තශාලාව සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් ලැබුණු ණය මුදල රු. 13,212,970,600 ක් වුවද, මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබාගත් තොරතුරු අනුව එම වටිනාකම රු. 10,859,986,560 ක් වුයෙන් භාවිතා කළ විනිමය රේටයේ රු.48,170,797 ක වෙනසද ඇතුළුව රු. 2,304,813,243 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) ඉන්වෙන්ට්‍රි ලේඛනය තුළ ඇතුළත් රු.30,890,878 ක් වටිනා චලනය නොවන අයිතම හා රු. 35,557,148 ක් වටිනා සෙමින් චලනය වන අයිතම සම්බන්ධයෙන් හානිකරන ගැලපීමක් හෝ වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. සෙසු ඉන්වෙන්ට්‍රි සඳහා රු. 11,352,785 ක වෙන්කිරීමක් කර තිබුණද එම ගණනය කිරීම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 1,460,028,918 | භෞතික සත්‍යාපන වාර්තා |
| ගව ආහාර | 7,856,860 | විස්තරාත්මක උපලේඛණයක් හා වයස් විශ්ලේෂණයක් |
| අත්තිකාරම් (Milk Can) | 16,114,541 | |
| ආපදා ණය (කළමනාකරන නොවන) | 41,076,727 | |
| ආපදා ණය (කළමනාකරන) | 21,377,987 | |
| උපචිත වියදම් | 4,207,457 | ශේෂය පියවීමට අදාල සාක්ෂි |
| වෙනත් ණය හිමියෝ | 12,005,844 | |
| ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ | 21,895,870 | නියැදියේ වියදම සත්‍යොක්ෂණය කිරීමට අදාල ලිඛිත සාක්ෂි |
| ණයගැතියෝ | 394,798,089 | ශේෂ සනාථන |
| පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂය | 6,616,885 | |
| පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂය | 94,333 | |
| එකතුව | 1,986,073,511 | |

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම, විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහත දක්වා ඇත.

(ආ) මෙම වාර්තාවේ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.327,084,631 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.12,299,511ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.339,384,142ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව දළ ලාභය රු.262,835,367 කින් වැඩිවීම හා පරිපාලන වියදම් රු.83,913,542 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.267,468,281ක ඌනතාවය 2014 වර්ෂයේ සිට සීඝ්‍ර වර්ධනයක් සහිතව සමාලෝචිත වර්ෂය වන විට රු. 327,084,631 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.773,035,900ක් වූ සමාගමේ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.1,507,168,721ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සහ බඩල්ගම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය හේතුවෙන් සමාගමෙහි අධිතෝලණ තත්ත්වයක් ඇතිවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මට (ව්‍යාපාර සැලැස්ම) ඇතුළත් විය යුතු වර්තමානයේ ආයතනය සතුව පවතින නිෂ්පාදන සහ මෙහෙයුම් පහසුකම්, කළමනාකරණ කුසලතා, තාක්ෂණික දැනුම,වෙළඳපොළවල් හා සැපයුම්කරුවන්, සංවිධාන ව්‍යුහය හා සැලසුම් කාල සීමාව තුළ ඉටු කළ යුතු ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කළමනාකරණ වගකීම යන කරුණු 2015 -2017 සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වියදම් පමණක් අයවැයගත කර තිබූ අතර මෙහෙයුම් වියදම් ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී සමාගම ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් හා ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා කිරිම සඳහා පිළිවෙලින් රු.මිලියන 514.61 ක් හා රු.මිලියන 140.75 ක් අයවැයගත කර තිබුණු නමුත් ඒ සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

මහ බැංකු වාර්තා අනුව වර්ෂ 2014 සිට 2016 දක්වා රටෙහි කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු කළ නමුත් රජය යටතේ කිරි එකතු කිරීම සිදුකරන මිල්කෝ සමාගමේ කිරි එකතු කිරීම 2014 වර්ෂයේ කිරි නිෂ්පාදනයෙන් සියයට 22.51 ක් වුවද 2016 වර්ෂයේදී එය සියයට 22.04 ක් වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3 හා 4.2.6 පරිදි 2016 වර්ෂයේ කාර්ය සාධන වාර්තා පිළියෙල කර කාර්තුමය,අර්ධ වාර්ෂික හා වාර්ෂික වශයෙන් ඉදිරි පත් කර නොතිබූ බව නිරීක්ෂනය විය.

(ආ) තොගය සඳහා ප්‍රමාණවත් රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබුණි.

(ඇ) පොළොන්නරුව කිරි කර්මාන්ත ශාලාවට වසර 8-10 අතර කාලයකට පෙර නෙස්ලේ සමාගමෙන් ලැබුණු ඉංජිනේරු තොග අයිතම අගය කර පොළොන්නරුව කිරි කර්මාන්ත ශාලාවේ පොත්වලට ගෙන නොතිබුණු අතර එම වටිනාකමින් සමාගමෙහි වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය</u>

(i) ශ්‍රී ලංකාවෙහි කිරි පරිභෝජනය ඉහළ නැංවීමේ ප්‍රතිපත්තිය යටතේ කොන්ත්‍රාත්කාර ආයතනය මඟින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට ලබාදෙන ලද යෝජනාවලියකට අනුව කර්මාන්තශාලා 4 ක් නවීකරණය කිරීම, කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 80 ක් අළුත්වැඩියා කිරිම හා නව මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් ඇගයීමට ලක් කිරීමෙන් පසු ඉදිරිපත් කරන ලද වාර්තාවකට අනුව යූරෝ. මිලියන 39.1 කට ප්‍රදානය කිරීම සඳහා 2009 දෙසැම්බර් 31 දින සමාගම සහ විදේශ ආයතනය අතර ගිවිසුමක් අත්සන් කර තිබුණි. නමුත් 2011 ජුනි 24 දින සමාගමේ සභාපති විසින් එම ආයතනයට ලිපියක් යොමු කර යූරෝ මිලියන 2.37 ක් වෙන් කර තිබූ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 80 ක් අළුත්වැඩියා කිරීම හා කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීමේ පිරිවැය ඇතුළු කාර්යන් කීපයක පිරිවැය ඉවත්කර පොලොන්නරුව, දිගන හා අඹේවෙල කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා යූරෝ මිලියන 33.78 කට නව යෝජනාවක් ඉදිරිපත් කර නැවතත් 2012 ජනවාරි 12 දින ගිවිසුමකට එළඹ තිබුණි.

යන්ත්‍ර ධාරිතාවය උපරිමයෙන් සිදුවනු ඇති බව උපකල්පනය කරමින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පළමු ව්‍යාපෘතිය ඇගයීමට ලක්කර තිබුණු අතර 2012 ජනවාරි 12 දින අනුමත කරන ලද ව්‍යාපෘති ගිවිසුම් මඟින් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉවත් කිරීම හා විකල්පයන් ඉදිරිපත් නොවීම හේතුවෙන් කිරි නිෂ්පාදනය අපතේයාමක් සිදුවී තිබුණි.

(ii) ඉහත නව යෝජනාව යටතේ පොලොන්නරුව, දිගන, හා අඹේවෙල යන කර්මාන්තශාලා නවීකරණය සඳහා ටෙන්ඩර් කැඳවීමෙන් තොරව නිමකර භාර දීමේ (Turnkey) ක්‍රමය යටතේ තෝරාගත් විදේශ කොන්ත්‍රාත් ආයතනය හා මිල්කෝ පුද්ගලික සමාගම අතර එළඹී ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තු කාලය 2014 ජුලි 12 දිනෙන් අවසන් විය යුතුය. නමුත් දිගන හා අඹේවෙල කිරි කර්මාන්තශාලා නවීකරණ කටයුතු 2017 ජුලි 31 දින දක්වා නිම වී නොතිබූ අතර දෙපාර්ශවයෙන් කිසිදු පාර්ශවයක් කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කර ගැනීමට හෝ මණ්ඩලය විසින් ප්‍රමාද ගාස්තු වශයෙන් එකඟ වී ඇති වටිනාකම අය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. 2017 ජූලි වන විට ගිවිසුම මාස 36 කට වඩා ප්‍රමාදව පවතින අතර ප්‍රමාද ගාස්තුව ලෙස යුරෝ 1,688,961 ක මුදලක් අයකර ගත යුතු නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) සමාගම කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා විදේශ සමාගමක් සමග 2012 වර්ෂයේදී එළඹෙන ලද කොන්ත්‍රාත් ගිවිසුම් වල එකඟ වූ පරිදි HSBC බැංකුව හා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අතර මෙන්ම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා සමාගම අතර 2013 වර්ෂයේදී ඇති කරගත් ණය ගිවිසුම අනුව ණය මුදලින් යූරෝ 28,712,328 ක් වූ කොටසක් සඳහා සියයට 2 ක ණය පොලී අනුපාතයක් හා ඉතිරි යූරෝ 5,066,881 ක් සඳහා සියයට 6 ක පොලියට, ලන්ඩන් අන්තර් ඒක්ෂන බැංකු ණය පොලී අනුපාතය එකතු කොට ගත් වාණිජ ණය පොලී අනුපාතයකට එකඟවී ඇති අතර ඒ අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා මණ්ඩලය අතරත් එම පොලී අනුපාත යටතේම උපණය ගිවිසුමකට එළඹ තිබුණි. එම ණය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවිය යුතු මුදල රු. 3,554,761,168 ක් විය. ඒ අනුව අදාල ගිවිසුම් ප්‍රකාරව මුදල් ගෙවීම් සඳහා මණ්ඩලය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) **බඩල්ගම ව්‍යාපෘතිය**

-----------------------

පශු සම්පත් හා ග්‍රාමීය අමාත්‍යාංශ ලේකම්ගේ 2013 නොවැම්බර් 25 දිනැති ලිපිය අනුව,සමාගම සතු නාරාහේන්පිට කර්මාන්තශාලාව බඩල්ගම වෙත ගෙන යෑමේ ව්‍යාපෘතිය සඳහා 2013 ජුනි 05 දිනැති අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් විදේශ ආයතන 2 ක් ඇගයීමට ලක් කර වඩාත් වාසිදායක ආයතනය තෝරා ගෙන තිබුණි. එසේ වුවද සමාගමේ සභාපති වරයාගේ උපදෙස් මත ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද ආයතනය වෙනුවට, ඇගයීමට ලක්කරන ලද අනෙක් ආයතනය වෙත නිමකර භාරදීමේ පදනම මත කොන්ත්‍රාත්තුව පිරිනමා 2015 අප්‍රේල් 23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබා දී තිබුණු අතර 2015 මැයි 19 දින ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ තිබුණි. ණය මුදලින් කොටසක් සඳහා සියයට 1.90 ක ණය පොලී අනුපාතයක් හා ඉතිරි කොටස සඳහා සියයට 5 ක පොලියට, ලන්ඩන් අන්තර් ඒක්ෂන බැංකු ණය පොලී අනුපාතය එකතු කොට ගත් වාණිජ ණය පොලී අනුපාතයක් මත ලබාගත් රු. 9,932,709,286 ක ණය මුදල යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 ජුනි 05 දිනැති අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද ආයතනය ඉදිරිපත් කරන ලද ලංසුවට වඩා යුරෝ මිලියන 10 ක (රු.මිලියන 1750) වැඩි ලංසුව ඉදිරිපත් කළ ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ii) ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2014 අගෝස්තු 20 දින ඉදිරිපත් කර ඇති කමිටු වාර්තාවට අනුව ගොඩනැගිලි හා අනෙකුත් උපාංග ඉදිකිරීම් වල අගය දළ වශයෙන් යුරෝ 4,000,000 (රු.596,952,800) එනම් ඇස්තමේන්තු ගත සාධාරණ අගයට වඩා ඉහළ අගයක් ගෙන තිබුණු අතර මිල්කෝ ආයතනය නවීකරණ වැඩ පිළිවෙල යටතේ, අපේක්ෂිත දෛනික කිරි ප්‍රමාණය වූ කිරි ලීටර් 650,000 සීමාකාරි සාධකයක් වන බව දක්වා තිබුණි.

(iii) මිල්කෝ සමාගමට ණය ගෙවීමට හැකියාව නොමැති බවත්, සමාගම මුදල් ප්‍රවාහයෙහි අර්බුදයක සිටින බවත් යෝජිත කර්මාන්ත ශාලා නවීකරණය මඟින් කිරි සපයා ගැනීමේ අර්බුදයකට මුහුණදිය හැකි බැවින් ව්‍යාපෘති ප්‍රතික්ෂේප කිරීමට 2015 මාර්තු 04 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2015 මාර්තු 07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද අදාල ණය මුදල් වසර තුනක සහන කාලයක් හා මිල්කෝ සමාගමට ප්‍රතිණයක් ලෙස ලබාදීමට යටත්ව ව්‍යාපෘතියට එකඟතාවය දක්වා නැවතත් අමාත්‍ය මණ්ඩල සටහනක් 2015 අප්‍රේල් 08 දින ඉදිරිපත් කර එයට, 2015 අප්‍රේල් 23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. නමුත් ඉහත ව්‍යාපෘතිය සඳහා සමාගම හා මහා භාණ්ඩාගාරය අතර ප්‍රතිණය ගිවිසුමකට 2018 ඔක්තෝබර් 19 දින දක්වාම ඇතුලත්වී නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ප්‍රකාරව කාර්ය මණ්ඩලය සඳහා බඳවාගැනීමේ පරිපාටි සකස් කර 2018 ඔක්තෝබර් 25 දක්වාම අනුමත කරවා ගෙන නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ කාර්ය මණ්ඩල තත්ත්වය පහත පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | අතිරික්ත/(පුරප්පාඩු) කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| විධායක | 12 | 57 | 45 |
| තෘතීයික | 179 | 150 | (29) |
| ද්විතීක | 802 | 468 | (334) |
| ප්‍රාථමික | 427 | 779 | 352 |
| පුහුණු සහ වෙනත් | | 17 | 17 |
| **එකතුව** | **1420** | **1471** | **51** |

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| සැලසුම් කිරීම | රජය අපේක්ෂිත අරමුණු හා ඉලක්ක වෙත ලඟා වීම සඳහා අවශ්‍ය වන සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ලේඛනය, හා කාර්යසාධන වාර්තා ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කර සකස් කර නොතිබුණි. |
| තොග කළමනාකරණය | තොග ක්‍රමවත්ව ගබඩා නොකිරීම හේතුවෙන් විනාශ වී තිබීම, කල් ඉකුත් වූ තොග පැවතීම ගණනය කිරීම අවිධිමත් වීම. |